විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 09/2015 (සංශෝධන II)

මගේ අංක - විවැ/චක්‍රලේඛ/2017
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10
2017.11.09

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

**<u>මරණ පාරිතෝෂිකය ගෙවීම, සංශෝධිත මරණ පාරිතෝෂික ගෙවීම් කිරීම සහ සංශෝධිත විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම.</u>**

**<u>(විශ්‍රාම වැටුප් සංශෝධිත අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම.)</u>**

උක්ත කරුණ සම්බන්ධව නිකුත් කරන ලද 2015.09.14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 09/2015 හා 2016.02.08 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 9/2015 (සංශෝධන I) හි උපදෙස් වලට අමතර වශයෙනි.

**02.**විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය මාර්ගගතව (online) සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම සේවාවන් සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.pensions.gov.lk හි PMS (Pension Management System) ලෙස විශේෂ යොමුව (link) ඔස්සේ සම්බන්ධ විය හැක.

**03.**මෙම සේවාව ප්‍රථම වරට ලබා ගැනීමේදී අදාළ රාජ්‍ය ආයතනය හා භාවිතා කරන නිලධාරීන් ලියාපදිංචි විය යුතු අතර ඉන් අනතුරුව ලබා දෙන මුර පද (password) භාවිතා කර පද්ධතියට ඇතුළු විය හැක. දැනටමත් PMS පද්ධතියෙහි ලියාපදිංචි වී ඇති රාජ්‍ය ආයතන නැවත ලියාපදිංචිවීම අවශ්‍ය නොවේ.

**04.මෙමගින් ලැබෙන සේවාවන්**

1. රාජ්‍ය නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප සංශෝධනය වන අවස්ථාවකදී විශ්‍රාම වැටුප් අයදුම්පත (PD 06) මාර්ගගතව (Online) යොමු කිරීමට හැකිවීම.
2. සංශෝධිත ප්‍රදාන පත්‍රයේ ආකෘතිය (භාණ්ඩාගාර 79) මුද්‍රණය කර ගැනීමේ පහසුකම් (මෙය ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ පසු වලංගු වේ.)
3. විශ්‍රාම වැටුප් සංශෝධන කඩිනමින් ඉටුකර ගැනීම හා ඒ සඳහා භාවිත කාලය අවම කරගැනීමට හැකියාව ඇතිවීම.
4. අයදුම්පත සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවක තොරතුරු බලාගැනීමට ඇති හැකියාව.

**05.** ඉහත සේවාවන් සඳහා පිවිසීම සම්බන්ධ සම්පූර්ණ උපදෙස් මාලාව ඇමුණුම් 01 ලෙස මෙම චක්‍රලේඛයට අමුණා ඇත. ඊට අමතරව www.sathkara.pensions.gov.lk/guidlines යන වෙබ් යොමුව (Web link) මඟින් ඉහත මෘදුකාංගය භාවිතා කරන ආකාරය ශ්‍රව්‍ය දෘශ්‍ය (video) මාධ්‍යයෙන්ද දැක බලා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

**06.** මෙම සේවාව **2017.11.10** දින සිට ක්‍රියාත්මක වන අතර එදින සිට පැරණි ක්‍රමවේදය මඟින් එවනු ලබන විශ්‍රාම වැටුප් සංශෝධිත දඬ අයදුම්පත් (PD 06) භාර ගනු නොලැබේ.

**07.** රාජ්‍ය සේවයේ කාර්යක්ෂම හා ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණයේ භාවිතය වැඩි දියුණු කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ගන්නා ක්‍රියාමාර්ගයන් සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ සහයෝගය අපේක්ෂා කරමි.

**08.** මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය මත නිකුත් කෙරේ.

**ඒ.ජගත් ඩී.ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :-

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | කරු.දැ.ගැ.ස |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - | එම |
| 3. | අමාත්‍ය මණ්ඩල ලේකම් | - | එම |
| 4. | ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | - | එම |
| 5. | විගණකාධිපති | - | එම |